ප්‍රතිපෝෂණ කාර්ය ප්‍රශ්න පත්‍ර 03

# බුද්ධ ධර්මය



**නිපුණතා** 11.8.3, 10.8.3, 11.8.4

අ.පො.ස (සා.පෙළ) උපකාරක කාර්යය පත්‍රිකා


ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාව,

අධ්‍යාපන අමාත්‍යාංශය,

ඉසුරුපාය

බත්තරමුල්ල.

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර 3

1. මුල් කාලයේ බුදුරජාණන් වහන්සේ වෙනුවට වන්දනාමාන කරන ලද සංකේත පහක් නම් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

2. බුදු පිළිමයක දැකිය හැකි මුද්‍රා හය නම් කරන්න.

.......................................................... ..........................................................

.......................................................... ..........................................................

.......................................................... ..........................................................

3. බුද්ධ ප්‍රතිමා කලාවේ දැකිය හැකි ආසන වර්ග තුනක් නම් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

4. ආබද්ධ හා අනාබද්ධ පිළිම උදාහරණ සහිතව හඳුන්වා දෙන්න.

<u>ආබද්ධ පිළිම</u>

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

## අනාබද්ධ පිළිම

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

5. ප්‍රතිමාසර වර්ග තුන නම් කරන්න.

.......................................................................
.......................................................................
.......................................................................

6. මහනුවර යුගයේ චිත්‍ර දැකිය හැකි ස්ථාන පහක් නම් කරන්න.

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

7. මහනුවර යුගයේ සිටි චිත්‍ර ශිල්පීන් තිදෙනෙක් නම් කරන්න.

.......................................................................

.......................................................................

.......................................................................

8. මහනුවර යුගයේ චිත්‍රවල දැකිය හැකි විශේෂ ලක්ෂණ පහක් ලියා දක්වන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

9. එම් සාර්ලිස් මහතා විසින් චිත්‍ර අදින ලද ස්ථාන හතරක් නම් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

10. සෝලියස් මෙන්දිස් මහතා විසින් චිත්‍ර අදින ලද ස්ථාන හතරක් නම් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

11. ජෝර්ජ් කීට් මහතා විසින් චිත්‍ර අදින ලද ස්ථානයක් නම් කරන්න.

..........................................................................................................................

12. ඇල්බට් ධර්මසිරි මහතා විසින් චිත්‍ර අදින ලද ස්ථානයක් නම් කරන්න.

..........................................................................................................................

13. අනුරාධපුර සාහිත්‍යය යුගයට අදාළව පහත වගුව සම්පූර්ණ කරන්න.

| සාහිත්‍යය කෘතිය | කතෘ | වස්තු විෂය | කෙටි හැදින්වීමක් |
|---|---|---|---|
| හෙළටුවා | - | | |
| සියබස්ලකර | - | | |
| සිඛවළඳ හා සිඛවළඳවිනිස | - | | |
| ධම්පියා අටුවා ගැටපදය | - | | |
| සීගිරි ගී | - | | |

14. පොළොන්නරු සාහිත්‍යය යුගයට අදාළව පහත වගුව සම්පූර්ණ කරන්න.

| සාහිත්‍යය කෘතිය | කතෘ | වස්තු විෂය | කෙටි හැදින්වීමක් |
|---|---|---|---|
| අමාවතුර | | | |
| ධර්මප්‍රදීපිකාව | | | |
| බුත්සරණ | | | |
| මුවදෙව්දාවත | | | |
| සසදාවත | | | |

15. දඹදෙණි සාහිත්‍යය යුගයට අදාළව පහත වගුව සම්පූර්ණ කරන්න

| සාහිත්‍යය කෘතිය | කතෘ | වස්තු විෂය | කෙටි හැදින්වීමක් |
|---|---|---|---|
| පූජාවලිය | | | |
| සද්ධර්මරත්නාවලිය | | | |
| දහම්සරණ | | | |
| සඟසරණ | | | |
| කව්සිළුමිණ | | | |
| සිදත්සඟරාව | | | |
| පියුම්මල් නැමති නිඝණ්ඩුව | | | |
| එළු සඳැස් ලකුණ | | | |

16. කුරුණෑගල සාහිත්‍යය යුගයට අදාළව පහත වගුව සම්පූර්ණ කරන්න

| සාහිත්‍යය කෘතිය | කතෘ | වස්තු විෂය | කෙටි හැදින්වීමක් |
|---|---|---|---|
| පන්සිය පනස් ජාතක පොත | | | |
| සිංහල බෝධිවංශය | | | |
| ථූප වංශය | | | |

ආදර්ශ ප්‍රශ්න පත්‍ර 3

පිළිතුරු

1. බෝධිය, වජ්‍රාසනය, පද්මය, සිරිපතුල, ධර්ම චක්‍රය හා ස්තූපය

2. 1. ධ්‍යාන මුද්‍රාව 2. අභය මුද්‍රාව 3. විතර්ක මුද්‍රාව

4. ධර්ම චක්‍ර මුද්‍රාව 5.භූමි ස්පර්ශ මුද්‍රාව 6. වරද මුද්‍රාව

3. 1. වීරාසනය 2. භද්‍රාසනය 3. පද්මාසනය

4. ආබද්ධ පිළිම
පිළිමයට පිටු පසින් ගලක් හෝ වෙනත් බාහිර ආධාරකයක් ඇති ව නිමවා ඇති පිළිම ආබද්ධ පිළිම ලෙස හැඳින්වේ. ප්‍රසිද්ධ අවුකන බුද්ධ ප්‍රතිමාව එයට නිදසුනකි.

අනාබද්ධ පිළිම

පිළිමයට පිටු පසින් ගලක් හෝ වෙනත් බාහිර ආධාරකයක් නොමැති ව නිමවා ඇති පිළිම අනාබද්ධ පිළිම ලෙස හැඳින්වේ. මාළිගාවිල හිටි පිළිමය එයට නිදසුනකි.

5. 1. ගන්ධ කුටි 2. පාසාද 3. ගෙඩිගේ

6. දෙගල් දොරුව විහාරය, මැදවල විහාරය, රන්ගිරි දඹුළු විහාරය, කුරුණෑගලට සමීප ව ඇති රිදී විහාරය, බඹරගල විහාරය හා කැලණියේ පැරණි විහාර මන්දිරය ය.

7. දෙවරගම්පොළ සිල්වත් තැන, හිරියාලෙ නයිදෙ, දේවේන්ද්‍ර මූලාචාරියා

8. චිත්‍ර ඇඳීමේ දී රේඛා කර්මය හා වර්ණ පූර්ණය යන අංග දෙකින් යුතු ව එය සිදුකර ඇත. එනම් පළමුවෙන් රූපවල බාහිර රේඛා ඇඳ අනතුරුව වර්ණ යොදා රූපය සම්පූර්ණ කිරීමයි.

රතු, සුදු, කහ, කළු යන වර්ණ වැඩි වශයෙනුත් නිල් සහ කොළ පාට අඩුවෙනුත් යොදාගෙන ඇත.

කහ සහ සුදු පාටින් ඇඳි සිතුවම් රතු පසුබිමක දක්නට ලැබේ.

මිනිස් රූප, සත්ත්ව රූප හා ගස් වර්ග ස්වාභාවික පරිසරයේ පවත්නා ආකාරයෙන් ම ඇඳීම මේ අයගේ සම්ප්‍රදාය නොවී ය.

අඳින ලද එම රූප සැබෑ මනුෂ්‍ය හා සත්ත්වයින්ගේ භෞතික ශරීරයට අනුගත නොවේ. අඟපසඟ ද ශරීර පරිමානුකූල ව නිමවා නැත.

මිනිස් රූපවල මුහුණෙන් හෝ අත් සහ ඇඟිලිවලින් අදහස් ප්‍රකාශ කිරීමට උත්සාහ ගත් බවක් ද දැකිය නොහැකි ය.

ගැහැනු හා පිරිමි රූප සිත්කලු ලෙස ඇඳ රසිකයින් ආකර්ෂණය කර ගැනීමට ද සමත් නොවේ. එළිය අඳුර දැක්වීම හෝ පර්යාවලෝකය (ළඟ සහ ඈත වස්තු පෙනෙන ආකාරය) දැක්වීම ද සිදු කර නැත.

අඛණ්ඩ කථන ක්‍රමයට සිතුවම් ඇඳීම මේ යුගයේ ජනප්‍රිය වී ඇත. එනම් කිසි යම් කතා පුවතක එක් චිත්‍ර රාමුවක් නොව ඒ හා සම්බන්ධ සිදුවීම් පෙළක් නිරූපණය කිරීමයි.

9. කොළඹ මාළිගාකන්ද විහාරය, අශෝකාරාමය, ඉසිපතනාරාමය, වේළුවනාරාමය, පොතුපිටියේ පූජාරාමය

10. මාවිල සුමන කුසුමාරාමය, රණස්ගල්ල විහාරය හා මැද්දෙපොල විහාරය

11. බොරැල්ලේ ගෝතමී විහාරය

12. සේදවත්තේ වෙහෙරගොඩැල්ල විහාරය

13. අනුරාධපුර සාහිත්‍යය යුගයට අදාළව පහත වගුව සම්පූර්ණ කරන්න

| සාහිත්‍යය කෘතිය | කතෘ | වස්තු විෂය | කෙටි හැඳින්වීමක් |
|---|---|---|---|
| හෙළටුවා | - | - | පාලි භාෂාවෙන් තිබූ ත්‍රිපිටක ධර්මයට සිංහල භාෂාවෙන් සපයන ලද අර්ථකථනයන් ය. |
| සියබස්ලකර | - | - | ''පෙදෙන් බුදු සිරිතැ - බසින් වත් සිරිත් ඈ.....'' යනුවෙන් කෘතිය ආරම්භයේ ම සඳහන් වෙයි. එතැන් පටන් මෙරට නිර්මාණකරුවන් විසින් සාහිත්‍ය කෘති සඳහා තේමා කර ගනු ලැබුවේ බෝසත් චරිතය හා බුද්ධ චරිතයයි |
| සිඛවළඳ හා සිඛවළඳවිනිස | - | - | භික්ෂූන් වහන්සේලාගේ පරිශීලනය සඳහා රචනා වී තිබේ. |

| | | | |
|---|---|---|---|
| ධම්පියා අටුවා ගැටපදය | - | - | ධම්ම පදයෙහි එන බුද්ධ දේශනාවන්ට ගැටපද හා විවරණ සැපයීම සඳහා කරන ලදී. |
| සීගිරි ගී | - | - | පළමු වන කාශ්‍යප රජුගේ වාසස්ථානය වූ සීගිරිය බැලීමට ගිය ජනතාව එහි කැටපත් පවුරේ ලියා ඇති පද්‍ය ගණන ඉතා විශාල ය. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් ඉන් පද්‍ය 685ක් කියවා ප්‍රකාශයට පත්කොට ඇත. |

14. පොළොන්නරු සාහිත්‍යය යුගයට අදාළව පහත වගුව සම්පූර්ණ කරන්න.

| සාහිත්‍යය කෘතිය | කතෘ | වස්තු විෂය | කෙටි හැඳින්වීමක් |
|---|---|---|---|
| අමාවතුර | ගුරුළුගෝමී පඬිතුමා | බුදුරජාණන් වහන්සේගේ පුරිස දම්ම සාරථී ගුණය වර්ණනා කරන්නකි. | පාලි භාෂාවෙන් පැවැති දමනකථා දහ අටක් පිළිබඳ ව ශ්‍රාවක ජනතාවට දැන ගැනීමට හැකිය. |
| ධර්මප්‍රදීපිකාව | ගුරුළුගෝමී පඬිතුමා | පාලි බෝධිවංශය පදනම් කරගෙන රචනා වූවකි. | බෝධීන් වහන්සේ වටා ගෙතුණු කතාවලින් සංගෘහිත වූවකි. |
| බුත්සරණ (අමෘතාවහ) | විද්‍යා චක්‍රවර්ති නම් පඬිවරයා | බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී ගුණ | ග්‍රන්ථයේ ආරම්භක පරිච්ඡේදවලින් බුද්ධ චරිතය හා සමහර ජාතක කතා මෙන් ම නව අරහාදි බුදුගුණ හා බුදුරජාණන් වහන්සේගේ දේශනා විලාශයන් පිළිබඳ ව ද විස්තර වේ. |
| මුවදෙව්දාවත<br><br>සසදාවත | - | මඛාදේව ජාතකය<br><br>සසා ජාතකය | සිංහලයෙන් රචනා වූ පැරණි ම ගී කාව්‍ය දෙකක් ලෙස මුවදෙව්දාවත හා සසදාවත සැලකේ. |

15. දඹදෙණි සාහිත්‍යය යුගයට අදාළව පහත වගුව සම්පූර්ණ කරන්න.

| සාහිත්‍යය කෘතිය | කතෘ | වස්තු විෂය | කෙටි හැඳින්වීමක් |
|---|---|---|---|
| පූජාවලිය | මයුරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමි | නව අරහාදී බුදුගුණවල අරහං ගුණය තේමා කරගෙන | දෙවන පැරකුම්බා රජුගේ ඇමැතියකු වූ දේවප්‍රතිරාජගේ ආරාධනාවෙන් මෙය නිමවන ලද බව සඳහන් වෙයි. පරිච්ඡේද 34 ක් ඇති මෙහි ගෞතම බුදුරජාණන් වහන්සේ සුමේධ තාපස අවධියේ දී දීපංකර බුදුරජාණන් වහන්සේගෙන් නියත විවරණ ගැනීමේ සිට පරිනිර්වාණය තෙක් වූ බුද්ධ චරිතය 32 වන පරිච්ඡේදය දක්වා ඉදිරිපත් කෙරේ. පරිච්ඡේද 33-.34 හි ලංකාවේ ඉතිහාසය II වන පැරකුම්බා රාජ්‍ය සමය දක්වා විස්තර වේ. |
| සද්ධර්මරත්නාවලිය | ධර්මසේන හිමි | පාලි ධම්මපදට්ඨ කතාව | ගැමි වහරට සමීප වූ උපමා උපමේයයන් බහුල ලෙස යොදා ගැනීමත්, චරිත නිරූපණයෙහි හා අවස්ථා නිරූපණයෙහි දක් වූ සාමර්ථ්‍යයත් ඉතා වැදගත් ය. චුල්ලතිස්ස කතා වස්තුවේ චුල්ලතිස්ස හිමියන් වයස්ගත ව පැවිදි වීම නිසා මාර්ග ඵල ලබා ගැනීමට නොහැකි වූ අයුරු ගැමි ජීවිතයට වඩාත් ළංවෙමින් උපමානුසාරයෙන් දක්වූයේ ''ගොයම් කළ මනා වක තබා පියා කල් පසු |

| | | | |
|---|---|---|---|
| | | | කොට කරන ගොයමක් සේ'' යනුවෙනි. මෙබඳු උපමා උපමේයයන් රැසක් ග්‍රන්ථය පුරාවට ම දැක ගත හැකිය. |
| දහම්සරණ | - | දහම් ගුණ | - |
| සඟසරණ | - | සඟ ගුණ | - |
| කව්සිළුමිණ කුසදා කව | දඹදෙණියේ රජකම් කළ දෙවන පැරකුම්බා නිරිඳුන් ය. | භාරතීය අලංකාර ශාස්ත්‍රය | මේඝදූතය වැනි සංස්කෘත මහා කාව්‍යයක අන්තර්ගත සර්ග බන්ධන ආදී කාව්‍ය රීති භාවිතයට ගනිමින් ශෘංගාර රසය දනවන ලෙස රචනා වී ඇති මෙය සර්ග 15 කින් හා ගී 770 න් යුක්ත වේ. එකල කව්සිළුමිණ ඉගෙනීම උගතෙකු වීමේ මගක් ලෙස සැලකිණ. |
| සිදත්සඟරාව | - | - | - |
| පියුම්මල් නැමති නිසණ්ඩුව | - | - | - |
| එළු සඳැස් ලකුණ | - | - | - |

16. කුරුණෑගල සාහිත්‍යය යුගයට අදාළව පහත වගුව සම්පූර්ණ කරන්න

| සාහිත්‍යය කෘතිය | කතෘ | වස්තු විෂය | කෙටි හැඳින්වීමක් |
|---|---|---|---|
| පන්සිය පනස් ජාතක පොත | - | පාලි ජාතකට්ඨකථාව | අප බුදුරජාණන් වහන්සේ පාරමීදම් පුරන සමයේ හෙවත් බොධිසත්ව අවධියේ දී උපන් ආත්මභාව පි |

| | | | |
|---|---|---|---|
| සිංහල බෝධිවංශය | - | පාලි බෝධිවංස | බෝධිසත්වයන් වහන්සේ බුද්ධත්වය ලබා ගැනීමේ දී සෙවණ දුන් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ඉතිහාසය මෙයින් විස්තර කෙරේ. මේ හැර ආනන්ද බෝධිය, ජය ශ්‍රී මහා බෝධිය ලංකාවට වැඩමවීම, අෂ්ටඵල රුහ බෝධි හා දෙතිස්ඵල රුහ බෝධි රෝපණය ආදී බොහෝ විස්තර මෙහි දක්නට ලැබේ. |
| ථූප වංශය | විද්‍යා චක්‍රවර්තී පරාක්‍රම පණ්ඩිත | - | ශාසන ඉතිහාසය පිළත් වී ඇත. ධාතු වර්ණනා හා එදා සමාජීය තොරතුරු මෙන් ම රුවන්වැලි සෑය නිර්මාණය සඳහා අමුද්‍රව්‍ය සැපයූ අයුරු, එය ගොඩනැගූ අයුරු ආදී බොහෝ තොරතුරු මෙහි දැකගත හැකි වේ. |



iruonline.com